# මී මැසි ජනපදයක රංචු බෙදී යාම පාලනය හා නව ජනපද නිෂ්පාදනය

මී මැස්සා පරිසරයට ඉතා සංවේදී කෘමියෙකි. පරිසරයේ වෙනස්වීම අනුව ජීවන රටාවේ ක්‍රියාකාරකම් වෙනස්වීම සිදු වේ. පරිසර සාධක පදනම් කරගෙන ජනපදයක ක්‍රියාකාරීත්වය අවස්ථා 03 කට බෙදිය හැක.

1. වර්ධක කාලය
2. පැණි වාරය
3. අහේනි කාලය

වර්ෂා සමයේ මී මැසි ජනපදයක ක්‍රියාකාරීත්වය බෙහෙවින් අඩු වේ. මෙම කාලයේ ශාකවල මල් හට ගැනීම අඩුවන අතර ජනපදවලට සැපයෙන ආහාර අඩු වේ. මෙම කාලය අහේනි කාලය ලෙස හඳුන්වයි. වර්ෂා සමය අවසාන වීමත් සමඟ ශාකවල මල් පිපීම ආරම්භ වන අතර ආහාර සුලභ වේ. ඒ සමඟම මී මැස්සන්ගේ ක්‍රියාකාරීත්වය වැඩි වන අතර ජනපදවලට ලැබෙන ආහාර ප්‍රමාණය වැඩි වේ. මේ අවස්ථාවේ රැජිණගේ බිත්තර දැමීමේ වේගය වැඩි වන බැවින්, එමගින් ජනපදයේ මැසි ගහනය ද වැඩි වේ. මෙය වර්ධක කාලයයි. මැසි ගහනය වැඩිවීමත් සමඟ ම ජනපදය තුළ ඇතිවන තදබදය නිසා නව රැජිණක් බිහි කර රංචු බෙදීයාමට පෙළඹේ.

මෙම රංචු බෙදී යාම මීළඟට එළැඹෙන පැණි වාරය ආරම්භයේ දී හෝ පැණි වාරය තුළ දී සිදු වේ. ජනපදයේ මැසි ගහනයෙන් 50% - 75% අතර සංඛ්‍යාවක් රංචු බෙදී යාමේ දී ඉවත් යයි. මෙසේ ස්වභාවිකව රංචු බෙදී යාමේ දී නව සනාවාස ඇති වීම සිදු වේ.

රංචු බෙදීයාම ස්වභාවිකව සිදුවීමට ඉඩ හැරීම වාණිජව මී මැසි පාලනය කිරීමේ දී අවාසිදයක වේ. රංචු බෙදී යාමේ දී ජනපදයක මැසි ගහනය අඩුවන අතර එය පැණි නිෂ්පාදනයට බලපායි. එමෙන්ම, ඉවත්ව යන රංචුව අල්ලා ගැනීමට නොහැකි වුවහොත් ජනපද අහිමිවීම සිදු වේ. එය වළක්වා ගැනීම සඳහා සුදුසුම අවස්ථාවේ අවශ්‍ය පරිදි කොටසක් වෙන් කර ගත යුතු වේ. මෙය කට්ටි බෙදීම නමින් මී මැසි පාලනයේදී හඳුන්වනු ලබයි.

## කට්ටි බෙදීමට සුදුසු අවස්ථාව හඳුනා ගැනීම

කට්ටි බෙදීමට පෙර කට්ටි බෙදීම සඳහා සුදුසු අවස්ථාව හඳුනා ගැනීම වැදගත් වේ. ජනපදයේ පිරිමි මැස්සන් සිටීම කට්ටි බෙදීමට සුදුසු අවස්ථාව පෙන්නුම් කරන ඉඟියකි. ජනපදයේ පිරිමි මැස්සන් සිටී නම් පස්වරු 3.00-6.00 අතර කාලයේ දී එළියට පැමිණේ. එසේ නොමැති නම් ජනපදය විවෘත කර පිරිමි මැස්සන් සිටී දැයි නිරීක්ෂණය කළ හැක.

කට්ටි බෙදීමට වැදගත් වන අනෙකුත් අවශ්‍යතාවය නම් රැජිණ කෝෂ ගොඩනගා තිබීමයි. පිලාපෙට්ටිය අඩියේ ලැල්ලෙන් ප්‍රවේශමෙන් ඉවත්කර වදවල පහළ කෙළවර පරීක්ෂා කිරීමෙන් රැජිණ කෝෂ ඇත්දැයි නිරීක්ෂණය කළ හැක.

කට්ටි බෙදීම සඳහා සාමාන්‍යයෙන් පිලා පෙට්ටිය හා පැණි පෙට්ටි 02 මැස්සන්ගෙන් පිරී තිබිය යුතු ය.

## කට්ටි බෙදීම

ජනපද බෙදීම පැණි වාරයට දින 45 කට වත් පෙර සිදු කිරීමෙන් හොඳ ප්‍රතිඵල ලබා ගත හැකිය. කට්ටි බෙදන අවස්ථාවේ ජනපදය තුළත් ප්‍රදේශය තුළත්, පහත සඳහන් තත්ත්වයන් තිබිය යුතුය.

- ❑ අවට පරිසරයේ හොඳින් පැණි පරාග තිබීම.
- ❑ වර්ෂාවෙන් තොර හොඳින් හිරු එළිය පවතින දිනයක් වීම.
- ❑ ජනපදය තුළ හොඳින් පැණි පරාග ගබඩා කර තිබීම.
- ❑ පිරිමි මැස්සන් සිටීම.

- රැජිණ කෝෂ ගොඩනගා තිබීම.
- වැඩකාර මැස්සියන්ගේ සංඛ්‍යාව වැඩි වී රංචු බෙදීයාමට සූදානම් වී තිබීම.
- විවිධ අවස්ථාවලින් යුත් පිලා වද තිබීම. (බිත්තර, කීට, පිලා)
- රැජිණ හොඳින් බිත්තර දමා තිබීම.
- ජනපදයේ ඇති පිලා වද ප්‍රමාණයෙන් 3/4ක් වත් සම්පූර්ණ වී තිබී.
- ලෙඩ-රෝග හා කෘමි හානිවලින් තොරවීම.

සවස් කාලයේ කට්ටි බෙදීම වඩාත් සුදුසු වේ. පැණි පරාග රැස් කිරීමට ඉවතට ගිය වැඩකාර මැස්සියන් සවස් කාලයේ ආපසු පැමිණේ. අවශ්‍යතාවය අනුව කට්ටි බෙදීම කළ යුතුය. ඒ අනුව, ක්‍රම තුනකට කට්ටි බෙදීම කළ හැක.

**1. අර්ධ ක්‍රමය**

මෙය සුදුසුම ක්‍රමය වේ. මෙහි දී ජනපදය සමානව කොටස් දෙකකට බෙදනු ලැබේ.

**2. තුනෙන් පංගු ක්‍රමය**

මෙහි දී ජනපදය සමාන කොටස් තුනකට බෙදනු ලැබේ. ජනපද වැඩි කර ගැනීම හෝ විකිණීම අරමුණ වන්නේ නම් මෙම ක්‍රමය යෝග්‍ය වේ.

**3. තුනෙන් දෙක/තුනෙන් එක ක්‍රමය**

මෙහි දී ජනපදය තුනෙන් දෙකක හා තුනෙන් එකක් ලෙස බෙදනු ලැබේ. තුනෙන් දෙක කොටස පැණි නිෂ්පාදනයට යොද ගත හැකිය. අනෙක් කොටස වර්ධනය වීමට ඉඩ හරිනු ලැබේ.

## කට්ටි බෙදන ආකාරය

මී මැසි ජනපදයේ පිලා පෙට්ටියේ වද රාමු එකිනෙක පරීක්ෂා කරන්න. රැජිණ සමඟ හොඳ තත්ත්වයේ පිලා වදයන් වෙනස් පෙට්ටියකට මාරු කර ගන්න. වයස් කාණ්ඩ දෙකක එනම්, මේරූ රැජිණ කෝෂයක් හා ළපටි රැජිණ කෝෂයක් මුල් පෙට්ටියේ ඉතිරිවන පරිදි පිලා වද පෙට්ටි දෙකට වෙන් කර ගන්න. රැජිණ සහිතව වෙන් කර ගත් කොටසේ රැජිණ කෝෂ ඇත්නම් ඉවත් කරන්න. පැණි පරාග අඩංගු වදයක් හා ප්‍රමාණවත්ව පිලා වද වසා ගැනීමට වැඩකාර මැස්සියන් ප්‍රමාණයක් ඇතුල් කර ගැනීමට අමතක නොකරන්න.

දැන් රැජිණ සමඟ ගත් කොටස මුල් ස්ථානයෙන් ඉවත් කර පැණි පරාග සුලභ ස්ථානයක තබන්න. ජනපද දෙකෙහි මැස්සියන් නැවත එකතුවීම වැළැක්වීම සඳහා ජනපද තැබිය යුත්තේ මීටර් 750 පමණ දුරකිනි.

රැජිණ සහිත කොටස ගැන එතරම් සැලකිල්ලක් දක්වීමට අවශ්‍ය නො වුවද රැජිණ රහිත කොටස පිළිබඳ වැඩි සැලකිල්ලක් දැක්විය යුතුය.

මෙහි දී, රැජිණ රහිත ජනපදයේ අලුත් රැජිණ බිහි වී පට්ටි වැටී බිත්තර දැමීම ආරම්භ වන තෙක් පරීක්ෂා කාරී විය යුතුයි. රැජිණ බිහි වී දින 3-4 කින් පට් ටි වැටීම සිදු වේ. රැජිණ පට්ටි වැටීම සඳහා ජනපදයෙන් ඉවත්ව යාමට මෙම කාලය තුළ ගේට්ටු තහඩුව ඉවත් කර තැබිය යුතුය.

බිත්තර දැමීම ආරම්භ වී ඇත්නම් අනෙක් රැජිණ කෝෂය කඩා ඉවත් කළ යුතුය. ඉන් පසු නව ජනපදයක් ලෙස නඩත්තු කරගෙන යාමට පුළුවන.

**කේ.ඩී.ජේ.කේ. කත්‍රිආරච්චි**
**කෘෂිකර්ම උපදේශක**
**මී මැසි සංවර්ධන ඒකකය - බිඳුනුවැව.**

**බොරු වර්ණනා කරුවන්ගෙන් ප්‍රවේසම් වන්න. ඔවුහු ඔබට කවන්නේත් පොවන්නේත් හිස් හැන්දකිනි.**
**- කොසිනෝ ඩෙග්රෙග්‍රියෝ -**